**කොළඹ විශ්වවිද්‍යාලය**

**ශ්‍රී පාලි මණ්ඩපය**

**ජනමාධ්‍ය අධ්‍යයන අංශය**

**ජනමාධ්‍ය ශාස්ත්‍රවේදි (ගෞරව) උපාධි පාඨමාලාව**

**<u>යෝග්‍යතා පරීක්ෂණය- 2022</u>**

2021/2022 අධ්‍යයන වර්ෂය සඳහා විද්‍යාර්ථීන් බඳවා ගැනීමේ යෝග්‍යතා පරීක්ෂණය මාර්ගගත (online) ක්‍රමයට පැවැත්වීමට කටයුතු සලසා ඇත.

ඒ අනුව ජනමාධ්‍ය අධ්‍යයන අංශයේ යෝග්‍යතා පරීක්ෂණය ඔබගේ දැනුම සහ කුසලතාවලට අදාළ සහතිකපත් හා ලිපි ලේඛන මාර්ගගතව ලබා ගෙන ඇගයීම සිදු කිරීමට නියමිතය.

ඒ සඳහා පහත සඳහන් වගුවට අනුව ඔබගේ දැනුම සහ කුසලතාවලට අදාළ සහතිකපත් හා ලිපි ලේඛන ශ්‍රී පාලි මණ්ඩපයේ LMS ගිණුමට උඩුගත (upload) කළ යුතුය. (මෙයට අදාළ මාර්ගෝපදේශය පහත සඳහන් වේ)

**සහතික ඉදිරිපත් කිරීම සඳහා මාර්ගෝපදේශය**

| **අංකය** | **විස්තරය** |
|---|---|
| 01. | තොරතුරු සහතික කිරීමේ ලිපිය |
| 02. | අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ හා සාමාන්‍ය පෙළ සහතික |
| 03. | සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයන විෂයය හා සම්බන්ධ ක්‍රියාකාරකම් (කලාප, දිස්ත්‍රික්, පළාත් සහ ජාතික මට්ටම) |
| 04. | ඔබ වෙනත් ක්ෂේත්‍රයන් සඳහා දක්වන ලද කුසලතා සහ ඔබගේ නිර්මාණාත්මක කුසලතා (කලා, ක්‍රීඩා, පුවත්පත්වල පළ වූ ලිපි, පොත්, සඟරා, වෙනත් ලිපි, සඳැස්, නිසඳැස්, කාව්‍ය නිර්මාණ, ශ්‍රව්‍ය දෘශ්‍ය නිර්මාණ ආදිය) |

**සැ.යු.-**

1. මෙම මාර්ගෝපදේශය අවසානයේ ඇති සහතික කිරීමේ ලිපිය ඡායා පිටපත් කර හෝ අත් අකුරෙන් ලියා බලයලත් නිලධාරියෙකු (විදුහල්පති, ග්‍රාම නිලධාරි, සාමදාන විනිශ්චකාර, නීතිඥ හෝ රජයේ සේවයේ නියුතු මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරි) ඉදිරියේ අත්සන් කර ලිපිගොනුවේ මුල් පිටුව ලෙස ඉදිරිපත් කළ යුතුය. (බලයලත් නිලධාරියාගේ නිලමුද්‍රාව තැබිය යුතුය)

2. ඔබ පොතක් හෝ සඟරාවක ලිපියක් ඉදිරිපත් කරන්නේ නම්, පොත/සඟරාවේ මුල් පිටුව, ISBN අංකය, පටුන සහ ඔබගේ ලිපියේ මුල් පිටුව යොමු කිරීම ප්‍රමාණවත්ය. ඔබ පුවත්පතකට හෝ වෙනත් සාහිත්‍ය කෘතියකට ලියූ ලිපි සහ වෙනත් කුසලතා ඉදිරිපත් කරන්නේ නම් ඒවා ඔබගේම නිර්මාණ බවට බලයලත් නිලධාරියකු ලවා සහතික කර ඉදිරිපත් කළ යුතුය.

3. ඔබගේ සහතික/ලිපි ලේඛන එවිය යුතු ලිපි ගොනුවේ උපරිම ධාරිතාවය මෙගා බයිට් 64 (64MB) කි. එබැවින් ඔබ ලබාගත් **<u>ඉහළම සුදුසුකම් සහිත සහතිකපත් හා ලේඛන උඩුගත</u>** (upload) කිරීමට වගබලා ගත යුතුය.

4. ඔබගේ සහතික/ලේඛන උඩුගත (upload) කිරීමේදී ඉහත සඳහන් වගුවට අනුව අංකනය කළ යුතුය.

   නිදසුන -
   1. සහතික කිරීමේ ලිපිය
   2. අධ්‍යාපන සහතික
   3. විෂයට අදාළ සහතික
   4. වෙනත් සහතික/ලිපි

මෙම සියලුම ලිපි ලේඛන ගොනුවක් වන සේ PDF ආකෘතියට සකසා ලිපි ගොනුවේ නම ලෙස ඔබගේ විභාග අංකය ඇතුළත් කර (නිදසුන- AP22MMxxxx) ශ්‍රී පාලි මණ්ඩපයේ LMS ගිණුමේ පහත සඳහන් සබැඳියට (Link) උඩුගත කළ යුතුය.

LMS Link : - https://lms.spc.cmb.ac.lk/course/index.php?categoryid=176

Website : - https://spc.cmb.ac.lk/aptitude2022/

ඔබගේ ලිපිගොනුව උඩුගත (upload) කිරීමේ උපදෙස් මාලාව සහ LMS ගිණුම සක්‍රීය කිරීම පිළිබඳ විස්තර ශ්‍රී පාලි මණ්ඩප වෙබ් පිටුවේ ඉහත සබැඳියට පිවිසීමෙන් ලබා ගත හැක.

(ඔබ සපයන මෙම තොරතුරුවල යම් වරදක් සිදුව ඇත්නම්, ඒ පිළිබඳව පරීක්ෂක මණ්ඩලය වග කියනු නොලැබේ.)

5. ව්‍යාජ සහතිකපත් හෝ සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම ශ්‍රී ලංකා නීතිය අනුව දඬුවම් ලැබිය හැකි වරදකි. එවැනි ව්‍යාජ තොරතුරු සැපයූ බවට අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු වනු ඇත. ඔබ මෙම පරීක්ෂණයෙන් සමත්ව ශිෂ්‍යභාවය ලබාගත් අයෙකු ලෙස සිටියදී වුවද ව්‍යාජ තොරතුරු සහ සහතික පත්‍ර සපයා ඇති බවට අනාවරණය වුවහොත් ඔබගේ ශිෂ්‍යභාවය එකී කරුණු මත අහෝසි වන බව සිහි තබා ගත යුතුය.

6. සියළු සහතික හා නිර්මාණ ආදී ඉදිරිපත් කිරීම ඉතා පැහැදිලිව හා මනාව ඉදිරිපත් කළ යුතුය.

7. **ඔබගේ ලිපිගොනුව 29.09.2022 සිට 13.10.2022 දින දක්වා උඩුගත (upload) කළ යුතුය.**

**වැඩිදුර විස්තර සඳහා ආයතනයේ නිල වෙබ් අඩවිය පරිශීලනය කරන්න.**

**මේ සම්බන්ධව යම් ගැටලුවක් තිබේ නම් පමණක් කාර්යාල වේලාවන්හිදී පහත සඳහන් අංක අමතා උපදෙස් ලබා ගත යුතුය.**

දුරකථන අංක - කාර්යාලය - 034-2263617
ජනමාධ්‍ය අධ්‍යයන අංශය - 034-2263616
විද්‍යුත් තැපැල් ලිපිනය : aptitude@spc.cmb.ac.lk

# ශ්‍රී පාලි මණ්ඩපය - යෝග්‍යතා පරීක්ෂණය- 2022

## සහතික කිරීමේ ලිපිය

මුලකුරු සමග නම ..........................................................................

විභාග අංකය AP22MM……………….

ජාතික හැඳුනුම්පත් අංකය ..........................................................................

පාඨමාලාවේ නම ..........................................................................

ඉහත නම සඳහන් මා විසින් කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රී පාලි මණ්ඩපයේ ජනමාධ්‍ය ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ යෝග්‍යතා පරීක්ෂණය-2022 සඳහා යොමු කරනු ලබන සහතික/ලිපි ලේඛන සියල්ලක්ම මාගේ දක්ෂතා මත ලබාගත් ඒවා බවත් මෙම ලිපි ගොනුවේ ඇතුලත් සියලුම සහතික හා ලිපි ලේඛන ඒවායේ මුල් පිටපත්වල සත්‍ය පිටපත් බවත් සහතික කරමි. මා විසින් එවා ඇති ලිපි ගොනුවේ පිටු ගණන …… බව සහතික කරමි.

……………………

අයදුම්කරුගේ අත්සන

දිනය ………………

ඉහත නම සඳහන් අයදුම්කරු අද දින මා ඉදිරියේ අත්සන් කළ බව සහතික කරමි.

බලයලත් නිලධාරියාගේ නම .........................................

අත්සන .........................................

නිල මුද්‍රාව

දිනය ....................................